# කන්‍යා මරියාවන්ගේ ස්වර්ගාරෝපණ
## මංගලෝත්සවය

## පළමුවන දේව ප්‍රකාශනය එළිදරව්ව 11:19; 12: 1-6, 10

*එළිදරව්ව පොතෙන් උපුටා ගත් කොටසකි.*

"සූර්යයා පැළඳගෙන, පාද යට සඳ මඬල ද හිස මත තාරකා දොළසකින් යුත් කිරුළක් ද ඇති ස්ත්‍රියක් දුටිමි."

එවිට ස්වර්ගයෙහි තිබෙන දෙවියන් වහන්සේගේ මාලිගාව විවෘත කරන ලද්දේ ය. උන් වහන්සේගේ ගිවිසුම් කරඬුව මාලිගාව තුළ පෙනුණේ ය. එවිට විදුලි කෙටීම් ද ශබ්ද ද ගිගුරුම් ද භූමිකම්පාවක් ද, මහා ගල් වර්ෂාවක් ද විය.

තවද අහසෙහි පුදුම ලකුණක් විය. එනම්, සූර්යයා පැළඳගෙන, පාද යට සඳ මඬල ද හිස මත තාරකා දොළසකින් යුත් කිරුළක් ද ඇති ස්ත්‍රියකි. ගැබ්ගෙන සිටි ඇ, විලිරුජා විඳිමින් ප්‍රසව වේදනාවෙන් කෑගැසුවා ය. අහසෙහි තවත් පුදුම දර්ශනයක් විය. හිස් සතක් ද අං දසයක් ද තමන් හිස් මත කිරුළු සතක් ද ඇති මහා රතු මකරෙකි. ඌ උගේ වලිගයෙන් අහසේ තරුවලින් තුනෙන් කොටසක් ඇද, පොළොවට හෙළී ය. උපන් කෙණෙහිම දරුවා කාදමන පිණිස, මකරා ප්‍රසව වේදනාවෙන් සිටි ස්ත්‍රිය ඉදිරියෙහි සූදානම් ව බලා සිටියේ ය.

ස්ත්‍රිය ඒ සියලු මනුෂ්‍ය ජාතීන් යගදාවකින් ආණ්ඩු කරන පිරිමි දරුවෙකු ප්‍රසූත කළා ය. ඇගේ දරුවා දෙවියන් වහන්සේ හා උන් වහන්සේගේ සිංහාසනය වෙත ඇදගෙන යනු ලැබී ය.

ස්ත්‍රිය කාන්තාරයට පලා ගියා ය. එක් දහස් දෙසිය සැට දවසක් ඇය පෝෂණය කරන පිණිස දෙවියන් වහන්සේ විසින් පිළියෙල කරන ලද ස්ථානයක් ඇට එහි විය.

ඉන්පසු ස්වර්ගයෙහි මෙසේ කියන මහ හඬක් මට ඇසිණි: එනම්, "අපේ දෙවියන්

වහන්සේගේ ගැළැවීම ද බලය ද රාජ්‍යය ද ස්වකීය ක්‍රිස්තුස් වහන්සේගේ අධිපතිකම ද දැන් පැමිණ ඇත. මන්ද, අපේ දෙවියන් වහන්සේ ඉදිරියෙහි දිවා රෑ දෙක්හි අපගේ සහෝදරයන්ට චෝදනා කරන පැමිණිලිකාරයා පහතට හෙළන ලදි.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය — ගීතාවලිය 45:9-11, 15

**පිළිතුර:** දෙව් රජිඳුනි, ඔබේ අග රැජිණ ඔබ සිහසුනේ දකුණු පස වැජඹෙන්නීය.

**ගීය :** ඔබේ කුලකතුන් අතර රජ කුමරියෝ ඇත.
එපිර්හි රන් අබරණින් සැරසුණු ඔබේ අග රැජින
ඔබ සිහසුනේ දකුණු පසින් වැජඹෙන්නී ය.

දියණියනි, මා වදනට සවන් දෙන්න. ඒවා සිතට ගන්න.
ඔබේ ජාතිය, ඔබේ ගම රට සිතින් අමතක කරන්න.

එවිට නිරිඳු ඔබේ රූ සපුවට ප්‍රිය වනු ඇත:
ඔහු ඔබේ ස්වාමියා ය, ඔහුට අවනත වන්න.
සිත් සතොසින් ඇලළී ඔව්හු රජ මැදුරට පිවිසෙති.

## දෙවන දේව ප්‍රකාශනය — 1 කොරින්ති 15:20-26

*ශුද්ධ වූ පාවුලු තුමා කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"හැම දෙනාට ම පළමුවෙන් ක්‍රිස්තුස් වහන්සේය.
ඉන්පසු ව උන් වහන්සේගේ ආගමනයේ දී උන් වහන්සේ සන්තක අය ය."

එහෙත් සැබැවින් ම ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වී සිටින සේක් ම ය. මෙය මළවුන් උත්ථාන කරනු ලබන බවට සහතිකය වේ. මන්ද, එක මිනිසෙකු කරණකොටගෙන මරණය පැමිණියාක් මෙන් ම, එක මිනිසෙකු කරණකොටගෙන මළවුන්ගෙන් උත්ථානය ද පැමිණියේ ය. ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ සියල්ලෝ ම ජීවනයට පමුණුවනු ලබන්නෝ ය. එසේ

වන්නේ එක් එක්කෙනාට හිමි තැන අනුව ය. හැම දෙනාට ම පළමුවෙන් ක්‍රිස්තුන් වහන්සේ ය. ඉන්පසු ව, උන් වහන්සේගේ ආගමනයේ දී උන් වහන්සේ සන්තක අය ය.

පසුව අවසානය පැමිණේ. එවිට උන් වහන්සේ සියලු අධිපතිකම් ද බලය ද පරාක්‍රමය ද අහිබවා උන් වහන්සේගේ රාජ්‍යය දෙව් පියාණන් වහන්සේට භාර දෙන සේක. මන්ද, දෙවියන් වහන්සේ සියලු සතුරන් උන් වහන්සේගේ පාද යට දමන තුරු ක්‍රිස්තුන් වහන්සේ රජකම් කළ යුතු ම ය. නැති කිරීමට සිටින අන්තිම සතුරා මරණය වේ.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
මරියෝත්තමාවෝ ස්වර්ගයට ගෙන යන ලද්දා හ.
සුරදූත සේනාවෝ ප්‍රීති වන්නා හ.
ආලේලූයා!

## සුවිශේෂය ලූක් 1:39–56

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක."

දින ගණනකට පසු මරිය තුමී ය නැඟිට ජූදා කඳුකරයෙහි නුවරකට යුහු ව ගොස්, සෙකරියස්ගේ ගෙට ඇතුළු වී එලිසබෙත් හට ආචාර කළා ය. එලිසබෙත් මරිය තුමියගේ ආචාර බස් ඇසූ කල ඇගේ කුසෙහි දරුවා ඉපිලෙන්නට වන. එවිට එලිසබෙත් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ ව, මහ හඬින් උදන් අනමින්, "ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දී ය. ඔබ කුස ඔත් දරු එලය ද ආශිර්වාද ලද්දේ ය. මාගේ සමිඳාණන් වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් මම කවරෙක් ද? මක්නිසාද ඔබේ ආචාර හඬ මා සවන් ගත වූ

කෙණෙහි ම මා කුසෙහි දරුවා ප්‍රීතියෙන් ඉපිලී ගියේ ය. සමිඳාණන් වහන්සේගේ නාමයෙන් තමන් හට දුන් පොරොන්දුව ඉටුවන්නේ ම යයි විශ්වාස කළ තැනැත්ති භාග්‍යවන්තය" යි කීවා ය.

එවිට මරිය තුමී මෙසේ උදන් ඇනුවා යඃ

"මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි, මාගේ ආත්මය මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයිඃ මක්නිසා ද, එතුමාණෝ සිය දාසියගේ දීනතාව කුළුණු පාමින් සලකා වදාළ සේක.

හැම පරපුරක් ම මෙතැන් සිට, 'භාග්‍යවන්තීය' යි මට කියනු ඇත.

පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක.

'පරිශුද්ධයාණෝ' යනු එතුමන්ගේ නාමය ය.

එතුමන්ගේ දයාව සිය බැතිමතුන් කෙරේ, පරපුරෙන් පරපුරට පැතිරේ.

සිය බාහුවෙන් එතුමාණෝ විකුම් පා, උඩගු උදම් සිතැත්තන් විසුරුවා හැර, මහ නරපතීන් සිය සිහසුන්වලින් පහත හෙළා, දීනයන් ඉහළ නංවා උසස් කළ සේක.

සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා, ධනවතුන් හිස අතින් හරවා යැවූ සේක.

අප පියවරුන් වූ ආබ්‍රහම්ට හා එම පරපුරට, සඳහට ම පොරොන්දු වූ දයාව සිහිකරමින්, සිය සේවක ඉශ්රායෙල් සෙනඟ හට, පිහිට වූ සේක.

මරිය තුමී, එලිසබෙත් සමඟ තෙමසක් පමණ නැවතී සිට සිය නිවසට පෙරළා ගියා ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

දේව මාතාවන්ගේ ස්වර්ගාරෝහණ මංගල්‍යය 2016 -08-15

<u>තේමාව</u> : 'අප දේව කැමැත්ත තේරුම්ගෙන දිවි ගෙවමින් සමිඳුන්ගේ සාමය අත්දකිමු.¶

<u>හැඳින්වීම</u>
පිය දෙවිඳු කැමැත්ත සොයමින් නිතර එයට හිස නමන්නට සූදානමින් සිටි අප මෑණියන්, දෙවිඳුන්ගෙන් වරම් ලබා, ආත්ම ශරීර පිටින් සුරලොවට වැඩීමේ මංගල්‍යය බැතියෙන් සමරන මෙදින, නොයෙකුත් නපුරේ බලවේගයන් පැතිරී යන මේ යුගයේ ජීවත් වන අප සැමට නිවැරදි දෙය තෝරාගෙන, ඒ මඟ තුල ගමන් කරන්නටත්, දේව කැමැත්ත තේරුම්ගෙන දිවි ගෙවීම තුළින් ලැබෙන සාමය සතුට අත්දකින්නට අවශ්‍ය වරම් මරියමවුන් හා එකමුතුව දෙවිපියාගෙන් ලබාදෙන ලෙස ඉල්ලමින්, මේ යාගයට සහභාගී වෙමු.

<u>ඇතුලුවීමේ ගීය</u> : කි. ගී. අංක 22- ගයමු වයමු.

<u>පළමු කියවීම සඳහා හැඳින්වීම</u> : එළිදරව්ව 11 : 19, 12:1-6, 10.
කිතු සමිඳාණන් තුළින් දේව ගැලවීමේදී රාජ්‍යද, බලයද ප්‍රකාශිත වූ ආකාරයත්, මරිමව්ගේ තේජශ්‍රීයෙන් මෙම පළමු කියවීම තුළින් පැහැදලි කරයි.

<u>මෙනෙහි කිරීමේ ගීය</u> : දේව වාක්‍ය සංග්‍රහයේ එදිනට නියමිත පිළිතුරු ගීය ගායනා කරන්න.

<u>දෙවන කියවීම සඳහා හැඳින්වීම</u>: 1 කොරෙන්ති 15 : 20-26
දෙවියන්වහන්සේ අප සැම දෙනවම පෝෂණය කරන බවත්, ජේසු සමිඳාණන්ගේ උත්ථානය තුළින් මරණය පරාජයකළ බව හා කිතු සමිඳාණන් තුළ විශ්වාසය තබන සියල්ලෝ උත්ථානයේ ජීවිතයකට ඇතුලුවන බවත් ශු. පාවුලුතුමා කොරෙන්තිවරුන්ට යවන ලද ලිපියෙන් විස්තර කරයි.

<u>සාධුකාරය</u> :ආලේලූයියා /// මරියාවෝ ස්වර්ගයට ගෙනයන ලද්දාහ. සුරදූත සේනා ප්‍රිති වන්නාහ. ආලේලූයියා ///

<u>ශු. සුවිශේෂය</u> : ලූක් 1 : 39-56

<u>විශ්වාසකයින්ගේ යැදුම්</u>

<u>පිළිතුර</u> : ස්වාමිනී අප කරන යාච්ඤා ඇසුව මැනව.

1. ආදර දෙවි පියාණනී, ජේසුතුමන්ට පිය දෙවි කැමැත්ත ඉටුකිරීම සඳහා නිරන්තරයෙන් මඟ පෙන්වූ මරිය මාතාවන් මෙන්, සැමවිටම පිය දෙවි කැමැත්ත සොයන්නටත්, එය ඉටුකරන්නටත් කිතු ජනතාව නිසි මඟ ගැන්වීම සඳහා කැපව ඇති සියලුදෙනාට අවශ්‍ය වරම් ලැබෙන පිණිස,

2. ආදර දෙවි පියාණනී, අප දිවයිනට මහත්සේ ප්‍රේම කරන දේව මෑණියන්ගේ මැදිහත්වීම තුළ අප රටට අවශ්‍ය එකමුතුකම ලඟාකර ගනු සඳහා අප රට නායකයින් සැම දිරිගන්වා, ඔවුන් නිසි මඟ ගන්වනු පිණිසද,

3. ආදර දෙවි පියාණනී, අද දින මේ දිව්‍ය යාගයට සහභාගීවන සියලුදෙනාහට මරියමව්ගේ මැදිහත්වීම තුළ වඩා යහපත් ජීවිත ගතකරමින්, අන් අයගේද ජීවිත හැඩගැස්සවීම සඳහා තම ජීවිතය බෙදාගැනීමට හැකිවන පිණිසද,

4. ආදර දෙවි පියාණනී, ජීවිතයේ විවිධාකාර අරගල මැද දිවි ගෙවන සියලුදෙනා හට සමිඳුගේ ආදරය ලැබ, ඔවුන්ට ජීවිත ගැටලු විසඳා ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලැබෙන පිණිස,

<u>පඬුරු පිදීමේ ගීය</u> : කි.ගී. අංක 118- මල් සුවදේ නැගලා

<u>අනුහවයේ ගීය</u> : කි.ගී. අංක 194- මා හද දොර ළඟ

<u>අවසාන ගීය</u> : කි.ගී. අංක 421- රිදී වලා ගැබින් නැගෙන

දලුගම අනෙක් පිට බලන්න